# බෞද්ධ සීල ප්‍රතිපදාවෙහි ප්‍රභේදයන් පිළිබඳ කෙටි හැඳින්වීමක්

දාපනේ චන්දරතන හිමි

බෞද්ධ ආචාර විද්‍යාවෙහි පදනම වශයෙන් සලකනු ලබන්නේ සීලය යි. බුදුදහමෙහි සීලය යනුවෙන් අදහස් කරනු ලබන්නේ කය, වචනය යන දෙකෙහි සංවර භාවය යි. (කාය වාචානං සමෝදානං සීලං) පුද්ගලයාගේ සමාජ හැසිරීම යහපත් වීම සඳහා යහපත් වචන භාවිතා කිරීම මෙන්ම යහපත් ක්‍රියාවන්හි නිරත වීම ද අත්‍යාවශ්‍ය වේ. මෙම මාධ්‍යයන් දෙක හසුරුවා ගැනීම තුළින් හිතකර සමාජ සම්බන්ධතාවක් ගොඩනැගිය හැකි වේ. පුද්ගලයාට මෙන්ම සමාජයට හිතකර ලෙස බලපාන බැවින් සීලය බෞද්ධ ආචාර විද්‍යාවෙහි පදනම ලෙස සලකනු ලැබේ. විශුද්ධි මාර්ගයෙහි හීලෑ වීම, හික්මවීම යන අර්ථයෙන් සීලය විස්තර කොට ඇත. (සීල නට්ඨෙන සීලං) තව ද එහි සඳහන් පරිදි ''ප්‍රාණඝාතාදී පව්වලින් වැළකී සිටිනහුගේ හෝ වත් පිළිවෙත්හි හැසිරෙන්නහුගේ චේතනාදීන් සීල නම් වේ.'' යනුවෙන් දක්වා ඇත. කුසල ධර්මයන් පිහිටීමට ආධාර වන බැවින් හිස (සිරස) යන අර්ථයෙන් ද හික්මවීම ඇතිවන බැවින් ''සීතල'' යන අර්ථයෙන් ද විශුද්ධි මාර්ගයෙහි වැඩිදුරටත් සීලය විස්තර කොට ඇත.[1]

සීල, සමාධි, ප්‍රඥා යන ආර්ය මාර්ගයෙහි පළමුවන පියවර සීලය නම් වේ. මෙම සීලය නැමැති පළමුවන පියවරෙහි නොපිහිටා දෙවන හා තෙවන පියවරයන්ට වර්ධනය කරගත නොහැක. ආර්ය මාර්ගයෙහි ගමන් ගන්නා පුද්ගලයන් අනුව බුදුදහමෙහි වෙන් වෙන් වශයෙන් සීලයෙහි ප්‍රභේදයන් ඉදිරිපත්

කොට ඇත. එබැවින් සාමණේර භික්ෂූන් වහන්සේලා උදෙසා සාමණේර දස සීලය ද උපසපන් භික්ෂූන් වහන්සේලා උදෙසා උපසම්පදා සීලය ද නිර්දේශ කර තිබේ. භික්ෂුණීන් වහන්සේලා උදෙසා අෂ්ට ගරු ධර්මවලින් යුක්ත වෙනම ම සීල ක්‍රමවේදයක් විනය පිටකයෙහි දක්වා ඇත. එසේම උපාසක උපාසිකාවන් සඳහා පංචසීලය, අෂ්ටාංග සීලය, ආජීව අෂ්ටමක සීලය මෙන් ම ඉතා කැපවීමෙන් සීලය රකින උපාසක උපාසිකාවන් සඳහා දස සීලය ද බුදුදහමෙහි නිර්දේශ කොට ඇත.

චාරිත්‍ර හා වාරිත්‍ර යනුවෙන් සීලයෙහි ප්‍රධාන කොටස් දෙකක් දක්වා ඇත. "මේ දේ කළ යුතුයි. යනුවෙන් පනවන ලද ශික්ෂා පද රැකීම චාරිත්‍ර සීලය නම් වේ. මේ දේ නොකළ යුතුයි. යනුවෙන් ප්‍රතික්ෂේප කළ දෑ වලින් වැළකී සිටීම වාරිත්‍ර සීලය නම් වේ.[2] විරමණය හා සමාදානය යනුවෙන් ද මෙය හැඳින්වේ. විරමණය යනු නොකිරීම හෙවත් වෙන් වීම යි. උදාහරණ ලෙස ඝාතනයෙන්, සොරකම් කිරීමෙන් වැළකී සිටීම සමාදන් වීම සමාදානය යි. උදාහරණ ලෙස කරුණාවෙන් මෛත්‍රියෙන් යමෙකුට සැලකීම සමාදානය යි.

ඉහත සඳහන් සීල ප්‍රභේදයන්ට අමතරව සීලයෙහි ප්‍රභේද රාශියක් විශුද්ධි මාර්ගයෙහි දක්වා ඇත. එක් වැදෑරුම්, දෙවැදෑරුම්, තෙවැදෑරුම්, සිවුවැදෑරුම්, පස්වැදෑරුම් ආදී ලෙස සීලයෙහි ප්‍රභේද 55 ක් පමණ විශුද්ධි මාර්ගයේ සීල නිර්දේශයෙහි දක්නට ලැබේ.[3]

එම ප්‍රභේදයන් මෙසේ ය.

1. එක් වැදෑරුම්.
   - I. සීලය වනාහී සීලයේ ලක්ෂණයෙන් එක් වැදෑරුම් වේ.
2. දෙවැදෑරුම්.
   - I. චාරිත්‍ර සීල, වාරිත්‍ර සීල
   - II. ආභිසමාචාරික, ආදිබ්‍රහ්මචරියක
   - III. විරති, අවිරති
   - IV. නිස්සිත,අනිස්සිත
   - V. කාලපරියන්ත, ආපානකෝටික
   - VI. සපරියන්ත, අපරියන්ත
   - VII.ලෞකික, ලෝකෝත්තර



3. තෙවැදෑරුම්.
   - I. හීන, මධ්‍යම, ප්‍රණීත
   - II. අත්තාධිපතෙය්‍ය, ලෝකාධිපතෙය්‍ය, ධම්මාධිපතෙය්‍ය
   - III. පරාමට්ඨ, අපරාමට්ඨ, පටිප්පස්සද්ධි
   - IV. විශුද්ධි, අවිශුද්ධි, වෙමතික
   - V. සේඛ, අසේඛ, නේවාසේඛනාසේඛ
4. සිව් වැදෑරුම්.
   - I. හානභාගිය, ඨිතිභාගිය, විසෙසභාගිය, නිබ්බේධභාගිය
   - II. භික්ඛු, භික්ඛුණී, අනුපසම්පන්න, ගහට්ඨ
   - III. පකති, ආචාර, ධම්මතා, පුබ්බහේතුක
   - IV. පාතිමොක්ඛ සංවර, ඉන්ද්‍රිය සංවර, ආජීව හා පාරිශුද්ධි, පච්චය සන්නිසිත
5. පස් වැදෑරුම්.
   - I. පරියන්ත පාරිසුද්ධි, අපරියන්ත පාරිසුද්ධි, පරිපුන්න පාරිසුද්ධි, අපරාමට්ඨ පාරිසුද්ධි, පටිපස්සධි
   - II. පහාන සීල, වෙරමණි සීල, චේතනා සීල, සංවර සීල, අවීතික්කම සීල

මෙම සීල ප්‍රභේදයන් අතර චතුපාරිසුද්ධ සීලය ඉතා වැදගත් වේ.

1. ප්‍රාතිමෝක්ෂ සංවර සීලය.
2. ඉන්ද්‍රිය සංවර සීලය.
3. ආජීව පාරිසුද්ධ සීලය.
4. පච්චය සන්නිස්සිත සීලය.[4]

ප්‍රාතිමෝක්ෂ සීලය යනු චාරිත්‍ර හා වාරිත්‍ර ප්‍රභේද ඇති ශික්ෂා පද වශයෙන් පැන වූ සීලය යි. යමෙකු විසින් මෙම සීලය රකිනු ලැබේ නම් අපායාදී දුකින් මිදෙයි. එබැවින් පාතිමොක්ඛ යැයි කියනු ලැබේ. ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස යන ඉන්ද්‍රියන්ට ගෝචර වන රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ සහ ධර්ම යන අරමුණු කෙරෙහි නොඇලී ඉන්ද්‍රිය සංවරය ඇති කර ගැනීම ඉන්ද්‍රිය සංවර සීලය නම් වේ. ආජීවය හේතුකොට ගෙන පනවා ඇති සය වැදෑරුම් ශික්ෂා පද කඩ නොකිරීම හා කුහන, ලපනා ආදී වශයෙන් නම් කොට ඇති මිථ්‍යා ජීවයෙන් වැළකීම ආජීව පාරිසුද්ධි සීලය නම් වේ. චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලානපච්චය යන සිව් පසය නුවණින් සලකා පරිභෝජනය කිරීම පච්චය සන්නිස්සිත සිත සීලය නම් වේ.

සීලයෙහි ප්‍රභේදයන් පිළිබඳව සලකා බැලිමේදී දීඝ නිකායෙහි බ්‍රහ්මජාල සූත්‍රයේ චූල සීල, මජ්ඣිම සීල, මහා සීල යනුවෙන් සීලයෙහි ප්‍රභේදයන් 03 ක් දක්වා ඇත.[5]

එනම්, චූල සීල යටතේ ප්‍රාණඝාතයෙන්, සොරකම් කිරීමෙන්, අබ්‍රහ්මචරියාවෙන්, මුසාවාදයෙන්, පිසුනාවාචයෙන්, පරුෂාවාචයෙන්, සම්ප්‍රප්ඵලාපයෙන් වැළකීමත්, බීජ, පැළෑටි විනාශ කිරීමෙන්, නොකල්හි ආහාර ගැනීමෙන්, නච්ච, ගීත, වාදිතයෙන්, මල්ගඳ විලවුන් ඇඟ දැරීමෙන්, උසසුන්, මහසුන් පිළිගැනීමෙන්, රන් රිදී මසු කහවනු පිළිගැනීමෙන් යන ආදියෙන් වැළකීමෙන් අමු මස් පිළිගැනීමෙන්, ස්ත්‍රීන්, කුමාරියන්, දාස දාසීන්, එළුවන්, තිරෙළුවන්, කුකුළන්, ඌරන්, ඇතුන්, අසුන්, වෙළඹුන්, ගවයින් පිළිගැනීමෙන් වැළකීමෙන්, වතුපිටි පිළිගැනීමෙන්, ගිහියන්ට දූත මෙහෙවර කිරීමෙන්, මුදල් ගනුදෙනු වලින්, හොර තරාදි වලින් කිරීමෙන්, බොරු රන් බඳුන්



පෙන්වා රැවටීමෙන්, හොර මිනුමෙන් රැවටීමෙන්, අල්ලස් ගෙන හිමියන් අහිමියන් කිරීමෙන්, නොයෙක් උපාය යොදා රැවටීමෙන්, බොරු රන් මැණික් ආදිය නියම රන් මැණික් ලෙස පෙන්වා රැවටීමෙන් වැළකීමත්, අනුනගේ අත් සිඳීමෙන්, මැරීමෙන්, බැඳීමෙන්, සැඟවී සිට අන්සතු දෑ පැහැර ගැනීමෙන්, අනුන්ට අයත් දේ බලහත්කාරයෙන් ගැනීමෙන් වැළකීමත් යන සියල්ලන්ගෙන් වැළකී සිටීම චූල සීල යනුවෙන් හැඳින්වේ.

මධ්‍යම සීල යනුවෙන් දක්වා ඇත්තේ පැලවෙන පැලවුණ බීජ වර්ග සිඳීමෙන් වැළකීම, ආහාර පාන ආදිය රැස්කොට තබාගෙන වාසය කිරීමෙන් වැළකීමත්, විනෝදාස්වාද ගෙන දෙන විවිධ දර්ශනවලින් වැළකීමත්, සූදුවෙන් වැළකීමත්, උසසුන් මහසුන් පිළිගැනීමෙන් වැළකීමත්, තම ශරීරය සැරසීමෙන් වැළකීමත්, නිශ්ඵල කතාවන්ගෙන් වැළකීමත්, කලහයන් ඇති කරන කතාවලින් වැළකීමත්, ගෙයින් ගෙට ගොස් දූත මෙහෙවර කිරීමෙන් වැළකීමත්, වංචනික ක්‍රියාවන්ගෙන් වැළකීමත්, මජ්ඣිම සීල යනුවෙන් දක්වා ඇත. එමෙන්ම මහා සිල ලෙස දක්වා ඇත්තේ ජීවිකාව සඳහා තිරශ්චීන විද්‍යාවන්ගෙන් හා වංචනික ක්‍රියාවන්ගෙන් වැළකී සිටීම යි.

සීලය ආරක්ෂා කිරීමෙන් ලැබෙන්නා වූ ආනිසංස පිළිබඳව ද විශුද්ධි මාර්ගයෙහි දක්වා ඇත. ඒ අනුව සීලයෙහි ආනිසංස 05 කි.

1. සිල්වත් තෙමේ මහත් වූ සැප සම්පත් ලබයි.
2. සිල්වත් තෙමේ මහත් වූ කීර්තියක් ලබයි.
3. සිල්වත් තෙමේ රජ බමුණු ආදී කවර පිරිසක් මැද වුව ද විශාරදව, නොපැකිළිව ගමන් කරයි.
4. සිල්වත් තෙමේ සිහියෙන් යුක්තව කාල ක්‍රියා කරයි.
5. සිල්වත් තෙමේ මරණින් මත්තෙහි සුගතියෙහි උපදියි.[6]

තව ද සීලයෙහි ආනිසංස පිළිබඳව විශුද්ධි මාර්ගයෙහි මෙසේ විස්තර කොට ඇත. ''සීලය වනාහී මේ ශාසනයෙහි සියලු

දෙනාටම එකම පිහිටය. පංච මහා ගංගාවන්ගේ ජලයෙන් ලබන පිරිසිදු බවට වඩා පිරිසිදු බවක් සීලයෙන් ලැබෙයි. සත්ත්වයන්ට පීඩා ගෙන දෙන පරිදාහය සීලය නිසා පහව යයි. සිල් සුවඳ දස අතට ම විහිදී යයි. සීලය සුගතියට නැගෙන්නට හිණි මගකි. නිවනට යන්නන්ට විවෘත කළ දොරටුවකි. සීලය හැමට ම වඩා බබළන ආභරණයකි. සිල්වත් හට තමාම තමාට නින්දා කිරීමෙහි උපදනා භය නසයි. ඔහුට කීර්තිය ද, ප්‍රීතිය ද ඇති කරයි.''

ලාභ, යස, ඤාති, අංග, ජීවිත අපේක්ෂා කොට සමාදන් වන සීලය ද සත් ආකාර මෛථුන සංයෝගයෙන් ද සීලය කිලිටි වන බව විශුද්ධි මාර්ගයේ සඳහන් වේ.

සප්ත මෛථුනය නම්,

1. කාන්තාවන්ගේ ස්පර්ශය ඉවසීම.
2. කාන්තාවන් සමග සතුටු සාමීචි පැවැත්වීම.
3. කාන්තාවන් දෙස රාග සිතින් බැලීම.
4. කාන්තාවන්ගේ හඬට කන් දීම.
5. කාන්තාවන් සමග අතීතයෙහි කළ කී දෑ සිහි කිරීම.
6. අනුන් විඳින කාම සැපතෙහි ලොල් බව දැක්වීම.
7. දිව්‍ය සම්පත් පැතීම.[7]

සිල් පද බිඳීම ද සතර ආකාරයෙන් සිදු වේ.

1. ඛණ්ඩ - සමාදන් වූ සීලයෙහි මුල හෝ අග සිල් පද බිඳීම.
2. ඡිද්‍ර - මැද සිල් පද බිඳීම.
3. සබල - තැනින් තැන සිල් පද බිඳීම.
4. කල්මාස - එකක් හැර එකක් සිල් පද බිඳීම.

සිල් බිඳගත් දුශ්සීලයාගේ දෝස 5 ක් පිළිබඳව විශුද්ධි මාර්ගයේ දක්වා ඇත.



1. දුශ්සීලයාගේ මහත් වූ බෝග විනාශ වෙයි.
2. දුශ්සීලයාගේ කීර්තිය විනාශ වෙයි.
3. දුශ්සීලයා නිතරම මුළු ගැනේ
4. දුශ්සීලයා සිහිමුලා වී මිය යයි.
5. දුශ්සීලයා මරණින් මතු දුකට වැටේ.[8]

මේ පස් ආකාරයට අමතරව දුශ්සීලයා දෙව් මිනිසුන්ට අමනොඥයෙක් වෙයි. සමග වසන්නන්ට අප්‍රිය වේ. පසුතැවිලි වෙයි. ගුණයෙන් පිරිහෙයි. සීලය පිරිසිදු වන ආකාරය පිළිබඳව විශුද්ධි මාර්ගයෙහි දක්වා ඇත. ඒ අනුව සමාදන් වූ සීලය කඩ නොකොට මනාව ආරක්ෂා කර ගැනීමෙන් ද කැඩුණු සිල් පද වත් මානත් පුරා ඇවැත් දෙසා පිළියම් කර ගැනීමෙන් ද සත් ආකාර මෛථුන ධර්මයන්ගෙන් වෙන් වීමෙන් ද ක්‍රෝධ, උපනාහ, මක්ඛ, පලාසිදි පාප ධර්මයන් දුරුකොට අල්පේච්ඡතාව, ලද දෙයින් සතුටු වීම ආදී ගුණධර්ම වර්ධනය කර ගැනීමෙන් ද සීලය පිරිසිදු බවට පත්වේ.

## ශික්ෂා පද

බෞද්ධ ශික්ෂා පද වර්ග දෙකකට අයත් වේ. එනම් ස්වභාවික රීති (පකති) සහ පනවන ලද රීති (පඤ්ඤත්ති සීල) වශයෙනි. සීල හෙවත් ස්වභාවික රීතීන් වලට අයත් වන්නේ පංච සීලය යි. එනම්,

1. හිංසාවෙන් වැළකීම.
2. නොදුන් දෙය ගැනීමෙන් වැළකීම.
3. කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීම.
4. බොරු කීමෙන් වැළකීම.
5. මදයට හා ප්‍රමාදයට හේතුවන මත්පැන් පානයෙන් වැළකීම.

පඤ්ඤත්ති සීල හෙවත් පනවන ලද සීලයෙහි අභිප්‍රාය වනුයේ ආධ්‍යාත්මික ගුණ ප්‍රගුණ කිරීමයි. අෂ්ටාංග සීලයෙහි කොටස් සහ දස සීලයෙහි කොටස් ලඤ්ඤත්ති සීල ගණයට අයිති වේ.

## පංචසීලය

බෞද්ධ ගිහියාගේ නිත්‍ය සීලය වනුයේ පංච සීලය යි. මිනිසා විසින් දුරාතීතයේ සිට පිළිගන්නා ලද ආචාර ධර්ම පද්ධතියක් පංච සීලයට අන්තර්ගත කොට ඇත. බුදු දහමෙහි හැරුණු විට ජෛන දර්ශනයෙහි ද ක්‍රිස්තියානි ධර්මයෙහි දස පනතෙහි ද අනෙකුත් බොහෝ ආගම්වල ද පංචසීලයෙහි කොටස් අන්තර්ගත වී ඇත. පංචසීලය පිළිබඳව දීඝ නිකායේ පහත සඳහන් ගාථාවෙන් දක්වා ඇත.

''පානාතිපාතං අදින්නාදානං - මුසාවාදෝච වුච්චත.
පරදාර ගමනඤ්චෙව - නප්පසංසන්ති පණ්ඩිතා''[9]

මෙහි ප්‍රාණඝාතය, හොරකම් කිරීම, කාමයෙහි වරදවා හැසිරීම සහ බොරුකීම පිළිබඳ සඳහන් වෙයි. යහපත් සමාජයක් බිහි වීමටත්, පවත්නා සමාජය සදාචාරාත්මක වශයෙන් විනාශ නොවීමටත්, අන්‍යෝන්‍ය වශයෙන් මිනිසුන් විසින් ආරක්ෂා කළ යුතු ආචාර ධර්ම 5 ක් පංචසීලයෙන් විස්තර කරනු ලැබේ. සියලු සත්වයින්ගේ හිත සුව පිණිස පවතින මෙම සදාචාර ධර්ම බෞද්ධයෙකු විසින් රැකිය යුතු අවම සදාචාර ප්‍රතිපත්ති ලෙස දක්වා ඇත. මිනිසාගේ ආරක්ෂාව සඳහාත් පැවැත්ම සඳහා ඉවහල් වන මූලික නීති මෙමගින් ආරක්ෂා වේ. පංචසීලය ගිහියාගේ නිත්‍ය සීලය වන අතර ම පැවිදි සීලය ද ඒ අනුව සකස් වී ඇත. එනම් භික්ෂුත්වය අහිමි කරන පරාජිකාවන් 04 කි. එයින් මෙවුන්දම් සෙවීම පංචසීලයෙහි තෙවන ශික්ෂා පදයට ද අදත්තා දානය පංචසීලයෙහි දෙවන ශික්ෂා පදයට ද මනුෂ්‍ය ජීවිතයක් නැති කිරීම පංචසීලයෙහි පළමුවන ශික්ෂා පදයට ද තමා තුළ නැති ගුණ කීම පංචසීලයෙහි 4 වන ශික්ෂා පදයට ද අයත් වේ. තවද රාජ්‍ය පාලනයෙහි මූලික ලක්ෂණ ද පංචසීලය පදනම් කොට ගෙන ඇති බව සක්විතිවත් වලින් පැහැදිලි වේ.



එනම් සක්විතිවත්වල පංචසීලය රාජ්‍ය නීතියක් ලෙස අන්තර්ගත කොට ඇත. ඒවා නම්,

1. පාණෝ නහන්තබ්බෝ - ප්‍රාණය නොනැසිය යුතුය.
2. අදින්නං න දාතබ්බං - නුදුන් දෑ නොගත යුතුය.
3. කාමෙසු මිච්ජා න චරිතබ්බා - කාමයෙහි වරදවා නොහැසිරිය යුතුය.
4. මුසා න භාසිතබ්බා - බොරු නොකිය යුතුය.
5. මජ්ජං න පාතබ්බං - මත් ද්‍රව්‍ය නොගත යුතුය.[10]

ධර්මාශෝක අධිරාජ්‍යා විසින් තම අධිරාජ්‍යයේ නීතිරීති වලට පංචසීලය අන්තර්ගත කොට ඇති බව ඓතිහාසික කරුණු වලින් පැහැදිලි වේ. අතීතයෙහි පමණක් නොව වර්තමානයෙහි ද සෑම රාජ්‍යකම පාහේ නීතිරීති වලට පංචසීලයෙහි අන්තර්ගත ආචාර ධර්ම ඇතුළත් වී ඇති බව එම රාජ්‍යන්ගේ නීතිරීති අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වේ. මේ කරුණු වලින් පැහැදිලි වන්නේ පංචසීලය තනි පුද්ගලයෙකුට පමණක් යහපත ගෙන දෙන්නක් නොව එය විශ්ව සාධාරණ ආචාර ධර්ම පද්ධතියක් බවයි. පංචසීලයෙන් තොර සමාජයක් යනු අනෙකාගේ ජීවත් වීමේ අයිතිය නැති කරන සමාජ සංස්ථාවකි. අනෙකාගේ වස්තුව විනාශ කරන සමාජයකි. ගෙදරක අඹුසැමි යුවලට යහපත් ලෙස ගත කිරීමට බාධා පමුණුවන සමාජයකි. වචනයෙන් අන්‍යෝන්‍ය විශ්වාසය රැකගැනීම වෙනුවට විශ්වාසය කඩකරන සමාජයකි. මත්වීමෙන් සහනය සෙවීම නිසා තමනුත් අන්‍යයනුත් විපතට පමුණුවන සමාජයකි. මේ තුළින් පැහැදිලි වන්නේ පංචසීලයෙන් තොර සමාජයක් යනු දූෂිත සමාජයක් බවයි. එබැවින් පංචසීලය ආරක්ෂා කිරීම ඕනෑම සමාජයක යහපැවැත්ම සඳහා ඉවහල් වේ. සමාජය යහපත් වීම සඳහාත් පුද්ගලයා සිල්වත් වීම සඳහාත් පංචසීලය ආරක්ෂා කළයුතු බව බුදුරජාණන් වහන්සේ මහානාම ශාක්‍යයන්ට දේශනා කොට වදාළේ එබැවිනි. (යතෝ බෝ

මහානාම උපාසකො පාණාතිපාතා පටිවිරතො හෝති.......... අදින්නා........... එත්තාවතා බෝ මහානාම උපාසකො සීලසම්පන්නෝ හෝති)

පංචසීලය ආරක්ෂා කිරීම පුද්ගලයාට හා සමාජයට පමණක් නොව පරිසරයට ද හිතකර වන බව එම සීලයන් එකින් එක අධ්‍යයනය කිරීම තුළින් පැහැදිලි වේ.

## 1. පාණාතිපාතා

බුදුරජාණන් වහන්සේ ධම්මපදයෙහි දේශනා කරන ලද්දේ සියලු සත්වයින් දඬුවමට හා මරණයට බිය දක්වන බැවින් තමන් උපමා කොටගෙන අනුන්ට හිංසා පීඩා කිරීමෙන් හා අනුන් ඝාතනය කිරීමෙන් වැළකිය යුතු බවයි.

**''සබ්බේ තසන්ති දණ්ඩස්ස**
**සබ්බේ භායන්ති මච්චුනො**
**අත්තානං උපමං තක්වා**
**න හනෙ‍්‍යය න ඝාතයෙ''**[11]

මෙහි සබ්බේ යනුවෙන් දක්වා ඇත්තේ මිනිසුන් පමණක් නොව සියලුම සත්වයින් ය. ජීවය ඇති සෑම සත්වයෙක්ම ඝාතනය කිරීමෙන් වැළකිය යුතු බව බුදු දහම පෙන්වා දේ. ඝාතනය කිරීම, හිංසා කිරීම, පීඩා කිරීම, ආදියෙන් වැළකීම පමණක් නොව සත්වයින් කෙරෙහි දයාව, මෛත්‍රිය ද පැතිර විය යුතු බව සාමඤ්ඤඵල සූත්‍රයෙහි සඳහන් පහත පාඨයෙන් පැහැදිලි වේ.

**''පාණාතිපාතං පහාය, පානාතිපාතා පටිවිරතෝ හොති**
**නිහිත දණ්ඩෝ, නිහිත සත්ථො**
**ලජ්ජි දයාපන්නෝ, සබ්බපානාභූත**
**හිතානුකම්පි විහරති''**[12]

මෙහි වැඩි දුරටත් සඳහන් කොට ඇත්තේ ප්‍රාණඝාතය කිරීමට තමා තුළ ලැජ්ජාවක් ද තිබිය යුතු බවයි. සුත්ත නිපාතයෙහි



ධම්මික සූත්‍රයෙහි පුද්ගලයා විසින් ප්‍රාණඝාතයෙන් වැළකිය යුතු ආකාරය පිළිබඳ මනාව පැහැදිලි කොට ඇත.

**''පාණං න හානෙ න ච ඝාතයෙය්‍ය -**
**නචානුජඤ්ඤා නහතං පරෙසං**
**සබ්බෙසු භූතේසු නිධාය දණ්ඩං -**
**යේ ථාවර යෙච තසන්ති ලොකේ''**[13]

මෙම ගාථාව තුළින් පැහැදිලි වන්නේ සෙලවෙන නැතහොත් ජංගම මෙන්ම නොසැලෙන නැතහොත් ස්ථාවර සියලු ජීවීන් කෙරෙහි දඬු බහා කප පරපන නොනසයි. අනුන්ලවා නොනසවයි. අනුන් විසින් පරපන නැසීමට අනුබල නොදෙයි යන්නයි. මෙම ගාථාවට අනුව පුද්ගලයා ක්‍රමවේද 3 ක් යටතේ පරපන නැසීමෙන් වළකිනු ලබයි. මෙහි සඳහන් ''ථාවර'' හා ''තස්ස'' යන වචන වලින් පැහැදිලි වන්නේ සෙලවෙන මෙන්ම නොසෙල් වෙන ජීවීන් යන්නයි. එනම් සෙලවෙන ජීවීන් යනු මිනිසුන් සතුන් ආදියයි. නොසෙල්වෙන ජීවීන් යනු ගස්වැල් ආදියයි. මේ තුළින් පැහැදිලි වන්නේ පළමු වන ශික්ෂා පදය ආරක්ෂා කිරීම සතත්වයන්ට පමණක් නොව පරිසරයට යහපත සැලසෙන බවයි. විනය පිටකයේ දී බුදුන් වහන්සේ දේශනා කොට වදාළේ ගස්වල අතු කැඩීම, පොළව කැනීම නිසා සතුන් විනාශ වීම නිසා එවැනි ක්‍රියාවල නිරත වන භික්ෂුවට ඇවතක් සිදුවන බවයි. තවද තම රට ජාතිය බේරා ගැනීමට, තමාගේ ආහාරයට ගැනීමට යන කිසිම කරුණක් නිසා ප්‍රාණඝාතය සිදු නොකළ යුතු බව බුදුදහමින් පෙන්වා දෙයි. එබැවින් මෙම ශික්ෂා පදය ආරක්ෂා කරන ජන සමාජයක් තුළ බියක් සැකක් නොමැතිව ජීවත් විය හැක.

## 2. අදින්නාදානා

පුද්ගලයා විසින් සමාජ ආරම්භයේ දී පළමු ව කරන ලද අපරාධය ලෙස චක්කවත්ති සිහනාද සූත්‍රයේ දී සොරකම දක්වා ඇත. සොරකම ආරම්භ වීම තුළින් අනෙකුත් අපරාධයන් සමාජයෙහි ජනිත වූ බව එම සූත්‍රයෙහි සඳහන් වේ.

"අදනානං දනෙ අනුපාදිය මානේ දාලිද්දියං වේපුල්ලං
මගමාසි, දාලිද්දියං වේපුල්ලං ගතේ, අදින්නාදානං
වේපුල්ලං මග මාසි, අදින්නාදානා වේපුල්ලං ගතේ
පානාතිපාතං වේපුල්ලං මගමාසි, පානාතිපාතං
වේපුල්ලං ගතේ මුසාවාදෝ වේපුල්ලං මගමාසි"[14]

ධනවතුන්ට දිළින්දන්ට ධනය නොදීම තුළින් සොරකම ඇති විය. සොරකම ඇති වීම තුළින් ප්‍රාණඝාතය සිදු කළහ. ප්‍රාණඝාතය සිදු කිරීම තුළින් මුසා බස් කීමට පුරුදු විය යන්න ඉහත සඳහන් පාඨයෙහි අර්ථය වේ. ධම්මික සූත්‍රයෙහි සොරකමෙන් වැළකිය යුතු ආකාර පහත පරිදි දක්වා ඇත.

"තතෝ අද්න්නං පරිවජ්ජයෙයා
කිංචි ක්වචි සාවකො බුජ්ඣමානො
න හාරයෙ හරතං නානුජඤ්ඤා
සබ්බං අදින්නං පරිවජ්ජයෙයා"[15]

මෙහි තේරුම වන්නේ "මෙය අනුන් සතු දෙයක් යැයි" දන්නා බුද්ධ ශ්‍රාවක තෙමේ, කුඩා වූ හෝ විශාල වූ හෝ කිසිවක් සොර සිතින් නොගන්නේ ය. අනුන් ලවා නොගත් වන්නේ ය. එසේ ගත්තවුන් හට නොඅනුදන්නේ ය. සියලුම නුදුන් දෑ ගැනීම අත්හැරින්නේ ය. මෙහි "කිංචි, ක්වචි" යනුවෙන් සඳහන් වන්නේ "කිසිම තැනක කිසිම දෙයක්" සොර සිතින් නොගන්නා බව ය. මේ තුළින් පැහැදිලි වන්නේ වරදක් යැයි නොපෙනේ. රාජ්‍ය දේපළ සොර සිතින් ගැනීම, වැඩි මිලට බඩු විකිණීම ආදිය ද සොරකම් බවය. බෞද්ධ සූත්‍රවල සඳහන් වන්නේ පුද්ගලයාට ගත හැක්කේ දුන් දෙයක් පමණක් බවය. එමෙන් ම එම දුන් දෙයින් සතුටට පත් වී තමා දසාචාරාත්මක ජීවිතයක් ගත කළ යුතු ය.

"දින්නාදායි, දින්න පටිකන්ති, තෙනෙන - සුචිභූතෙන අත්තේන විහරති"[16]

මෙම ශික්ෂා පදය ආරක්ෂා කිරීම සමාජ යහපැවැත්මට හේතුවන බව ඉහත සඳහන් උදාහරණවලින් පැහැදිලි වේ.



## 3. කාමේසු මිච්ඡාචාරා

විවාහ සංස්ථාවෙහි සදාචාරාත්මක භාවය ඇති කිරීම සඳහා මෙම ශික්ෂා පදය ඉවහල් වේ. මෙම සිල් පදයෙන් අදහස් වන්නේ විවාහක වූ ස්වාමි පුරුෂයා වෙනත් ස්ත්‍රියක් කරා යැමෙන් නැතහොත් පරදාර සේවනයෙන් වැළකිය යුතු බවයි. මෙහිදී කාන්තාව ද වෙනත් පුරුෂයෙකු කරා යැමෙන් වැළකිය යුතු බව අදහස් වේ. ඒ බව සිඟාලෝවාද සූත්‍රයෙහි සදිසා නමස්කාරයේ දී පැහැදිලිව දක්වා ඇත. එනම් ස්ත්‍රිය අනතිචාරී විය යුතු ය. මෙහිදී කාමේසු යනු පංච කාමයන්ගෙන් වැළකීම නොව පර-ස්ත්‍රීන් කරා යැමෙන් වැළකීම බව උගතුන්ගේ පිළිගැනීම වේ. ඒ සඳහා පහත උදාහරණය ඔවුන් ඉදිරිපත් කරනු ලැබේ.

"පඤ්ච කාම ගුණා එතේ - ඉත්ථි රූපස්මිං දිස්සරෙ
රූපා, සද්දා, රසා, ගන්ධ - පොට්ඨබ්බා ච මනෝරමා"[17]

මෙහි අර්ථය නම් රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන පංච කාමයන් ස්ත්‍රී රූපයෙහි අන්තර්ගත වේ යන්න ය. එබැවින් බුදුරජාණන් වහන්සේ තුන්වන ශික්ෂා පදයේ දී "කාමේසු" යනුවෙන් දක්වා ඇත්තේ ස්ත්‍රිය තුළ එම පංචකාමය අන්තර්ගත නිසා බව උගතුන්ගේ පිළිගැනීම වේ. කෙසේ වෙතත් 03 වන ශික්ෂා පදයෙහි සාමාන්‍ය අදහස පරදාර සේවනයෙන් වෙන්වීම බව ධම්මික සූත්‍රයෙහි පහත සඳහන් කරුණුවලින් පැහැදිලි වේ.

අබ්‍රහ්ම චරියං - පරිවජ්ජයෙයා
අංගාරකාසුං - ජලිතං ව විඤ්ඤූ
අසම්භුණන්තො - පන බ්‍රහ්මචරියං
පරස්ස දාරං - නාතික්කමෙයය"[18]

මෙහි අදහස නම් බුද්ධිමත් පුද්ගලයා මෛථුන සේවනය දිලිසෙන අඟුරු වලක් ලෙස සිතා බ්‍රහ්මචරියාවෙහි හැසිරෙන්නේ ය. බ්‍රහ්මචරියාවෙහි හැසිරිය නොහේනම් අඩුම තරමින් පරදාර සේවනයෙන්වත් වැළකිය යුතු ය. මෙහි පැහැදිලිව දක්වා ඇත්තේ පරදාර සේවනයෙන් වැළකිය යුතු බව

යි. එබැවින් 3 වන ශික්ෂා පදය පංච කාමයන්ගෙන් වෙන්වීමක් නොදක්වන අතර අඹු සැමි යුවල අතර සදාචාරය ගොඩනැගීම සඳහා පරදාර සේවනයෙන් වැළකිය යුතු බව සඳහන් කරනු ලැබේ. මෙසේ පුරුෂයෙකු නොයා යුතු ස්ත්‍රීන් 10 ක් පිළිබඳ සාලෙය්‍යක සූත්‍රයෙහි සඳහන් වේ. එනම්;

1. මාතුරක්ඛිතා
2. පිතුරක්ඛිතා
3. මාතුපිතුරක්ඛිතා
4. භගිනිරක්ඛිතා
5. ඥාති රක්ඛිතා
6. ගොත්ත රක්ඛිතා
7. ධම්ම රක්ඛිතා
8. සස්සාමිකා
9. සපරිදණ්ඩා
10. මාලගුණ පරික්ඛිතාපි[19]

මෙලෙස 3 වන ශික්ෂා පදය ආරක්ෂා කිරීම තුළින් වර්තමාන සමාජයෙහි උද්ගත වී ඇති බොහෝ පවුල් ගැටලු නිරාකරණය කරගත හැකි බව මෙම කරුණු අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වේ.

### 4. මුසාවාදා

සමාජය තුළ සත්‍ය ආරක්ෂා කිරීමත්, රැවටීම, වංචාව නැති කිරීමටත් මෙම ශික්ෂා පදය ඉවහල් වේ. බොරු කියන පුද්ගලයාට කළ නොහැකි පවක් නැතැයි ධම්මපදයෙහි සඳහන් වේ.

''ඒකං ධම්මං අතීතස්ස - මුසාවාදිස්ස ජන්තුනො
විතින්න පරලෝකස්ස - නත්ථි පාපං අකාරියං''[20]



ඉහත ගාථාවෙහි අර්ථය නම් ඇත්ත කීම නම් එකම දහම ඉක්ම වූ බොරු කියන සුළු වූ පරලොවක් ගැන බලාපොරොත්තු නැති පුද්ගලයාට කළ නොහැකි පාපයක් නොමැත යන්න යි. මජ්ඣිම නිකායෙහි සාලෙය්‍යක සූත්‍රයේ දී පුද්ගලයා විසින් මුසාවාදය සිද්ධ කරන ආකාර 04 ක් දක්වා ඇත.

| | |
|---|---|
| 1. ජානම් වා අජානම් ආහ | සත්‍ය දැන, නොදනිමි යැයි කීම. |
| 2. අජානම් වා ජානම් ආහ | සත්‍ය නොදැන, දනිමි යැයි කීම. |
| 3. පස්සම් වා අප්පසාමිති ආහ | සිද්ධිය දැක නොදැක්කෙමි යැයි කීම. |
| 4. අපස්සම් වා පස්සාමිති ආහ | සිද්ධිය නොදැක දැක්කෙමි යැයි කීම.[21] |

මෙලෙස පුද්ගලයා විසින් අසත්‍ය ලෙස සාක්ෂි ඉදිරිපත් කරනුයේ පහත සඳහන් කරුණු 3 හේතුවෙනි.

1. අත්ත හේතු - තමාගේ යහපතට.
2. පර හේතු - අනුන්ගේ යහපතට.
3. ආමිස හේතු - භෞතික දේ ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන්.[22]

ධම්මික සූත්‍රයේ දී පුද්ගලයා මුසාවාදයෙන් වැළකිය යුතු ආකාරය පහත පරිදි දක්වා ඇත.

''සභග්ගතොවො පරිසග්ග තෝවා
ඒකස්ස වෙකො න මුසා භණෙය්‍ය
න භාණයේ භණිතං නානුජඤ්ඤා
සබ්බං අභූතං පරිවජ්ජයෙය්‍ය''[23]

මෙහි සඳහන් පරිදි පුද්ගලයා සභා මැදකට ගොස් හෝ පිරිස් මැදකට ගොස් හෝ තනි පුද්ගලයෙකුට හෝ මුසා නොකියන්නේ ය. අනුන් ලවා නොකියවන්නේ ය. එයට අනුබල නොදෙන්නේ

ය. සෑම අභූතයක්ම දුරලන්නේ ය. සත්‍ය ප්‍රකාශ කිරීමට හා සත්‍ය දැන ගැනීමට පුද්ගලයාට අයිතියක් ඇති බව එක්සත් ජාතීන්ගේ සංවිධානයෙහි වගන්තිවල ද සඳහන් වේ. මේ තුළින් පැහැදිලි වන්නේ සමාජය තුළ සත්‍ය සන්නිවේදනය කිරීම සමාජ යහපැවැත්මට හා බොහෝ ගැටලු නිරාකරණය කර ගැනීමට ඉවහල් වන බව ය.

## 5. සුරාමේරය

මදයට හා ප්‍රමාදයට හේතු වන්නා වූ සියලු වර්ගවල මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැළකීම මෙම ශික්ෂා පදයෙන් අදහස් වේ. මත්ද්‍රව්‍ය භාවිතා කොට සිහිය විකල් වූ පසු බොරු කීම, සොරකම් කිරීම, ප්‍රාණඝාතය කිරීම, කාමයෙහි වරදවා හැසිරීම වැනි ඕනෑම අපරාධයක් සිදු කිරීමට පුද්ගලයා පෙළඹෙන බව වර්තමාන සමාජය තුළින් පැහැදිලි වේ. පහත සඳහන් වර්ගවලට අයත් සුරා භාවිතා නොකළ යුතු බව දහමෙහි සඳහන් වේ.

1. පිට්ඨ සුරා (කුඩු වර්ගවලින් නිෂ්පාදිත මත්ද්‍රව්‍ය)
2. පූව සුරා (පැණි රස වර්ගවලින් නිෂ්පාදිත මත්ද්‍රව්‍ය)
3. ඕදන සුරා (ධාන්‍ය වර්ගවලින් නිෂ්පාදිත මත්ද්‍රව්‍ය)
4. කින්නපක්ඛිත්තා (පැසවන ලද මත්ද්‍රව්‍ය)
5. සම්භාර සම්යුත්ත සුරා (ද්‍රව්‍ය කිහිපයක් කලවම් කොට නිෂ්පාදිත මත්ද්‍රව්‍ය)[24]

මෙම ඉහත සඳහන් මත්ද්‍රව්‍යවලට අමතරව, මල් වර්ගවලින් නිෂ්පාදිත මත්ද්‍රව්‍ය (පුප්ඵාසව) පලතුරු වර්ගවලින් නිෂ්පාදිත මත්ද්‍රව්‍ය (ඵලාසව) ආදී මත්ද්‍රව්‍ය ගැනීමෙන් ද පුද්ගලයා වැළකිය යුතු ය. ධම්මික සූත්‍රයේ දී සියලුම වර්ගවල මත්ද්‍රව්‍ය ගැනීමෙන් වැළකිය යුතු ආකාරය දක්වා ඇත.

"මජ්ජඤ්ච පානං න සමාචරෙය්‍ය
ධම්මං ඉමං රෝචයේ යෝ ගහට්ඨො
න පායයේ පිබතං නානු ජඤ්ඤා
උම්මාදනන්තං ඉති නං විදිත්වා"[25]



16 OCT 2017

මෙහි අර්ථය නම්, සිහිවිකල් බව ඇති කරවන්නේ යැයි දැන මත් පැන් පානයෙන් වළකින්නේ ය. අනුන් ලවා පානය නොකරවන්නේ ය. අනුන් මත් පැන් බීම ද නොඅනුදන්නේ ය. සිඟාලෝවාද සූත්‍රයේ දී මත්පැන් පානයෙහි ආදීනව 6 ක් දක්වා ඇත.

1. ධනය විනාශ වීම.
2. කලකෝලාහල වැඩි වීම.
3. රෝග උපද්‍රව බහුල වීම.
4. අපකීර්තිය ඇති වීම.
5. ලැජ්ජා නැති වීම.
6. නුවණ දුබල වීම.[26]

මෙලෙස මත්ද්‍රව්‍ය භාවිතය පුද්ගලයාගේ පරිහානියට මෙන්ම සමාජයේ ආචාර ධර්ම පරිහානියට ඉවහල් වේ. මෙම කරුණු තුළින් පැහැදිලි වන්නේ බෞද්ධ ආචාර විද්‍යාවෙහි ආචාර විද්‍යාත්මක උපයෝගීතාවකින් යුතු ආචාර ධර්ම පද්ධතියක් ලෙස පංචසීලය හැඳින්විය හැකි බව යි. ඕනෑම සමාජයක යහපැවැත්මට හේතුවන විශ්ව සාධාරණත්වයක් පංචසීලය තුළ අන්තර්ගත වී ඇති බව සෑම සමාජයකම නීතියක් ලෙස හෝ ආචාර ධර්ම පද්ධතියක් ලෙස හෝ එම කරුණුවලින් එකක් හෝ කිහිපයක් ආරක්ෂා කිරීම තුළින් පැහැදිලි වේ.

ඉහත සඳහන් දිනපතා ආරක්ෂා කරන පංචසීලයට අමතරව උපෝසථ දිනයන්හි ආරක්ෂා කරනු ලබන අෂ්ටාංග සීලයෙහි ශික්ෂා පද මෙසේ ය.

අෂ්ටාංග සීලයෙහි 1,2,3,4,5 යන ශික්ෂා පද පංචසීලයෙහි හා සමාන වේ. 3, 6, 7, 8 යන ශික්ෂා පද පහත පරිදි වේ.

3. අබ්‍රහ්මචරියා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
4. විකාලභෝජනා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

5. නච්චගීත වාදිත විසූඛ දස්සන මාලා ගන්ධ විලේපන ධාරණ මණ්ඩන විභූසනට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

6. උච්චාසයන මහාසයනා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

මෙහි 3 වන ශික්ෂා පදයෙන් බ්‍රහ්මචරියාවෙහි යෙදීම නැතහොත් අබ්‍රහ්මචරියාවෙන් වෙන් වීම අදහස් වේ. 6 වන ශික්ෂා පදයෙන් නොකල්හි ආහාරපාන ගැනීමෙන් වැළකීම පනවා ඇත. 7 වන ශික්ෂා පදයෙන් නැටුම්, ගැයුම්, වැයුම්, විසුළු දැකුම්, මල්ගඳ විලවුන් ආදිය දැරීමෙන් වෙන් වීමට පනවා ඇත. 8 වන ශික්ෂා පදයෙන් උස් අසුන් පරිහරණය කිරීමෙන් වැළකීම පනවා ඇත. මීට අමතරව ඉතා කැපවීමෙන් සීල සමාදානයෙහි යෙදෙන පුද්ගලයාට දස සීලය ද බුදු දහමෙහි නිර්දේශ කොට ඇත. අෂ්ටාංග සීලයට වඩා මෙහි ඇත්තේ වෙනස්කම් කිහිපයකි. එනම්,

7. නච්චගීත වාදිත විසූක දස්සනා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

8. මාලා ගන්ධ විලේපන දාරණ මණ්ඩන විභූසනට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

9. උච්චාසයන මහාසයනා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

10. ජාත රූප රජත පටිග්ගහනා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

මෙම 10 වන ශික්ෂා පදයෙන් අර්ථවත් වන්නේ රන්, රිදී, මසු, කහවනු පිළිගැනීමෙන් වැළකීම යි. භික්ෂූන් වහන්සේ නමක් ගත කරන ජීවිතයට හා සමාන හැසිරීමක් එක් දිනක් තුළ අෂ්ටාංග සීලය හෝ දස සීලය සමාදන් වීම තුළින් උපාසක උපාසිකාවන්ගෙන් බලාපොරොත්තු වේ. ආජීවක අෂ්ටමක සීලය ද ගිහියා විසින් ආරක්ෂා කළ යුතු සීලයකි. එහි අන්තර්ගත වන්නේ පංචසීලයෙහි පළමු පද 4 සහ 5 කේලම් කීමෙන්, 6 පරුෂ වචනයෙන්, 7 හිස් ප්‍රලාප කීමෙන්, 8 මිත්‍යා ආජීවයෙන් වැළකීම යි. සාමණේර භික්ෂූන් වහන්සේලා සඳහා බුදුන්



වහන්සේ විසින් අනුදැන වදාළේ ඉහත සඳහන් දස සීල ප්‍රතිපදාව යි. එමෙන්ම උපසපන් භික්ෂු භික්ෂුණීන් වහන්සේලා සඳහා භික්ෂු භික්ෂුණී ප්‍රාතිමෝක්ෂයෙහි පහත සඳහන් විනය නීති ආචාර ධර්ම පද්ධතියක් ලෙස බුදුන් වහන්සේ විසින් පනවා ඇත.

| විනය නීති | භික්ෂූන් වහන්සේලා | භික්ෂුණීන් වහන්සේලා |
|---|---|---|
| 1. පාරාජිකා | 04 | 08 |
| 2. සංඝාදිසේස | 13 | 17 |
| 3. අනියත | 02 | - |
| 4. නිසග්ගපචිතිය | 30 | 30 |
| 5. පචිතිය | 92 | 166 |
| 6. පටිදේශනිය | 04 | 08 |
| 7. සේඛියා | 75 | 75 |
| 8. අධිකරණසමථ | 07 | 07 |
| | 227 | 311 |

මෙලෙස බුද්ධ ශාසනයෙහි භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිවුවනක් පිරිසටම අදාළ වන ලෙස ආචාර ධර්ම පද්ධතියක් ගොඩනගා ඇති බව ඉහත කරුණුවලින් පැහැදිලි වේ. බෞද්ධයන්ට පමණක් නොව ඕනෑම සමාජයක ඕනෑම පුද්ගලයෙකු විසින් මෙම ශික්ෂා පද අනුගමනය කරනු ලැබුවත් ඒ තුළින් එම සමාජය යහපත් බවට පත් වේ.

## අනුපූර්ව ශික්ෂණය

අනුපූර්ව ශික්ෂණය යනුවෙන් අදහස් වන්නේ සීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිශික්ෂා ක්‍රමානුකූලව වර්ධනය කිරීම වේ. මෙම ත්‍රිශික්ෂා ආර්ය අෂ්ටාංගික මාර්ගයේ දී අධිසීල, අධිචිත්ත, අධිපඤ්ඤා යනුවෙන් ද හඳුන්වා ඇත. සංයුත්ත නිකායෙහි ජටා සූත්‍රයේ දී බුදුන්වහන්සේ දේශනා කරනු ලැබුවේ සීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිශික්ෂා වර්ධනය කරන පුද්ගලයාට සියලු සමාජ

ගැටලු නිරාකරණය කරගෙන පරම වූ යහපත් ජීවිතයක් ගත කළ හැකි බව ය.

**"සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො**
**චිත්තං පඤ්ඤඤ්ච භාවයං**
**ආතාපි නිපකො භික්ඛු**
**සො ඉමං විජටයේ ජටම්"[27]**

එසේම සීලය හා ප්‍රඥාව පුද්ගලයා තුළ සමානව පිහිටිය යුතු බව දීඝ නිකායේ සෝණදණ්ඩ සූත්‍රයෙහි සඳහන් වේ.

**"යත්ථ සීලං තත්ථ පඤ්ඤා යත්ථ පඤ්ඤා තත්ථ සීලං - සීලවතෝ පඤ්ඤා පඤ්ඤවතෝ සීලා"[28]**

සීලය ඇති තැන ප්‍රඥාවත්, ප්‍රඥාව ඇති තැන සීලයත්, සිල්වත් පුද්ගලයා තුළ ප්‍රඥාවත්, ප්‍රඥාවන්ත පුද්ගලයා තුළ සීලයත් ඇති බව ඉහත පාඨයෙන් පැහැදිලි වේ. විසුද්ධි මාර්ගයෙහි සීල, සමාධි හා පඤ්ඤා භූමි නිද්දේශවලට අනුව, සීල නිද්දේශයේ දී පනවන ලද සියලු ශික්ෂා පද ආරක්ෂා කිරීමත්, සමාධි නිද්දේශයේ දී සමථ භාවනාව සිද්ධ කිරීමත් පඤ්ඤාභූමි නිද්දේශයේ දී, පටිච්චසමුප්පාදානුකූල ප්‍රඥා භාවනාව හෙවත් විදර්ශනා භාවනාව වැඩෑමත් අදහස් කොට ඇති බව පැහැදිලි වේ. තව ද සීලය හෙවත් හික්මීම ඇති කරගැනීමත්, සමාධිය හෙවත් චිත්ත ඒකාග්‍රතාව ඇති කරගැනීමත්, ප්‍රඥා හෙවත් යථාර්ථය (යථානුභූත ඥාන දස්සන) අවබෝධ කරගැනීමත් යන මෙම ත්‍රිශික්ෂා නිවනෙහි මාර්ගය බව ආර්ය්‍ය අෂ්ටාංගික මාර්ගය තුළින් පැහැදිලි වේ.

අනුපූර්ව ශික්ෂණය හෙවත් ත්‍රිශික්ෂා පදනම්ව ඇත්තේ ආර්ය්‍ය අෂ්ටාංගික මාර්ගය මත ය. කාමසුඛල්ලිකානුයෝගය හා අත්තකිලමතානුයෝගය යන අන්ත දෙක අත්හැර මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කිරීම ආර්ය්‍ය අෂ්ටාංගික මාර්ගය නම් වේ. මෙය සීල, සමාධි, ප්‍රඥා යන කොටස් 03 ට පහත පරිදි බෙදා දැක්විය හැකි ය.



| | |
|---|---|
| 1. සම්මා දිට්ඨි | ප්‍රඥා |
| 2. සම්මා සංකප්ප | |
| 3. සම්මා වාචා | සීල |
| 4. සම්මා කම්මන්ත | |
| 5. සම්මා ආජීව | |
| 6. සම්මා වායාම | සමාධි |
| 7. සම්මා සති | |
| 8. සම්මා සමාධි | |

මෙහි සම්මා දිට්ඨි යනුවෙන් අදහස් කොට ඇත්තේ අනිච්චා, දුක්ඛ, අනත්තා යන ත්‍රිලක්ෂණ ධර්ම තුළින් ලෝකයෙහි යථාර්ථය අවබෝධ කරගැනීම යි. චතුරාර්ය සත්‍ය අවබෝධ කරගැනීම ද මෙයින් අදහස් කරනු ලැබේ. සම්මා සංකප්ප යනු නෙක්ඛම්ම සංකප්ප, අව්‍යාපාද සංකප්ප, අවිහිංසා සංකප්ප යන යහපත් සිතුවිලි තමා තුළ වර්ධනය කර ගැනීම යි.

දෙවන කොටසෙහි සීලය යටතේ ඇති සම්මා වාචා යන්නෙන් අදහස් කොට ඇත්තේ මුසාවාද, පිසුනාවාච, පරුෂාවාච, සම්පප්පලාප යන අයහපත් වචනවලින් වැළකී යහපත් වචන භාවිතා කිරීම යි. එම කොටසෙහි සම්මා කම්මන්ත යනු යහපත් ක්‍රියාවන්වල නිරත වීමයි. එනම්, පස්පව් වලින් වැළකී සිටීම යි. එහි සම්මා ආජීව යනු යහපත් ජීවිකාවයි. එනම්, මසු වෙළඳාම, වස වෙළඳාම, ආයුධ වෙළඳාම, සතුන් වෙළඳාම, මත්ද්‍රව්‍ය වෙළඳාම ආදී අයහපත් වෙළඳාමෙන් වැළකී රාජ්‍ය සේවය, කෘෂිකර්මාන්තය ආදී යහපත් ජීවිකාවන්වල නිරත වීමයි.

සමාධි කොටස යටතේ අන්තර්ගත වී ඇති සම්මා වායාම යනු කුසල් වර්ධනය කරගැනීමට උත්සාහ කිරීම යි. එනම්, නූපන් අකුසල් නූපදවීමට වෑයම් කිරීම, උපන් කුසල් නැති කිරීමට වෑයම් කිරීම, නූපන් කුසල් ඉපදවීමට වෑයම් කිරීම, උපන් කුසල් වැඩි දියුණු කිරීමට වෑයම් කිරීම යන සතර සම්‍යක්ප්‍රධාන වීර්ය

ඇති කරගැනීම යි. එහි සම්මා සති යනු කායානුපස්සනා, වේදනානුපස්සනා, චිත්තානුපස්සනා, ධම්මානුපස්සනා යන සතර සතිපට්ඨානය වැඩීම යි. එහි සම්මා සමාධි යනු සමථ භාවනාවෙහි ප්‍රථම, ද්විතීය, තෘතීය, චතුර්ථ යන ධ්‍යානයන් වැඩීම යි. මෙලෙස අනුපූර්ව ශික්ෂණය තුළින් බලාපොරොත්තු වන්නේ ආර්යාෂ්ටාංගික මාර්ගය මත පදනම් වූ සීල, සමාධි, ප්‍රඥා යන ත්‍රී ශික්ෂාවන් වර්ධනය කිරීම යි.

## ආන්තික සටහන්

1. විස්තරාර්ථ සන්න සහිත, විසුද්ධි මාර්ගය, අට්ඨකථාචාර්යය, ශ්‍රීමත් බුද්ධඝෝෂ මහා ස්ථවිර ප්‍රණීත, (2004), බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, පි. 9.
2. -එම. පි. 14.
3. -එම. පි. 14 - 15.
4. -එම. පි. 24.
5. සංක්ෂිප්ත ත්‍රිපිටක ග්‍රන්ථමාලා 1, සිංහල දික්සඟිය, (1998) බුද්ධ ශාසන අමාත්‍යාංශය, ත්‍රිපිටක ග්‍රන්ථ සම්පාදක මණ්ඩලය.
6. විසුද්ධි මාර්ගය පි. 11.
7. -එම. පි. 76 - 77.
8. -එම. පි. 78.
9. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා 9, දීඝනිකාය, තෘතිය භාගය (2006) ලංකා බෞද්ධ මණ්ඩලය පි. 290.
10. -එම. පි. 104.
11. ධම්මපදය (P.T.S) ගාථා 19.
12. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා 7 පි. 110.
13. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා 25, සුත්ත නිපාතය (2006) ලංකා බෞද්ධ මණ්ඩලය පි. 118.
14. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා 9. දිඝ නිකාය තෘතිය භාග පි. 114.
15. සුත්ත නිපාතය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව 25 2006, බෞද්ධ මණ්ඩලය පි. 113.
16.



17. අංගුත්තර නිකාය, පංචක නිපාතය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව 20. පි. 108 (2006).
18. සුත්ත නිපාතය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා 25, (2006) පි. 113.
19. මජ්ඣිම නිකාය, 1, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, 10 (2006) පි. 164.
20. ධම්මපද
21. මජ්ඣිම නිකාය, 1, පි. 164.
22. -එම.
23. සුත්ත නිපාතය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා 25, (2006) පි. 118
24. විනය පිටක. 4, පාචිත්තිය පාලි (P.T.S) පි 110.
25. සුත්ත නිපාතය, පි. 118.
26. දීඝනිකාය තෘතිය භාග, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා 9. (2006) පි. 292.
27. සංයුත්ත නිකාය I, (PTS), එන්ගලන්තය, පි. 13.
28. දීඝනිකාය ප්‍රථම භාග, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා 7. (2006) පි. 242.